**ශීර්ෂය 439**

**------------**

**බතික්, අත් යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය**

**---------------------------------------------------------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**--------------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**----------------------------------**

බතික්, අත් යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බතික්, අත් යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 18 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 3 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට බතික්, අත් යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව හා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) මෙම වාර්තාවේ 1.6.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ වාර්තාවේ සඳහන් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 1.6.1 මූලධන වියදම්

-----------------

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 හා 2021 වර්ෂවලදී අමාත්‍යාංශය විසින් එකතු වටිනාකම රු.4,581,375ක් වන ජංගම නොවන වත්කම් මිලදීගෙන ඇති බව වාර්තා වී තිබුණද භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශ SA 82 හි (ජංගම නොවන වත්කම් පිළිබඳ සාරාංශ වාර්තාව) ප්‍රකාරව මිලට ගත් වත්කම් වටිනාකම ලෙස යන්ත්‍ර හා උපකරණ යටතේ රු.3,093,716 ක් පමණක් වාර්තා කර තිබුණි. | වත්කම් කළමනාකරණය සඳහා භාණ්ඩාගාරය මෑත දී හඳුන්වා දී ඇති මාර්ගස්ථ ගිණුම්ගත කිරීමේ පද්ධතිය හරහා ඒවා වත්කම් වලට ඇතුලත් කිරීමේ දී යම් දෝෂ සිදු වී ඇති බව හඳුනාගෙන තිබෙන අතර ඒ පිළිබඳව භාණ්ඩාගාරය දැනුවත් කර ලබාදුන් උපදෙස් අනුව මේ වන විට නිවැරදි කර ඇති බව. | වර්ෂය තුළ මිලදී ගත් වත්කම් පිළිබඳ භාණ්ඩාගාරය වෙත වාර්තා කළ යුතුය. |
| (ආ) | අමාත්‍යාංශය වෙත අයිතිය පවරාගෙන නොමැති කර්මාන්ත අමාත්‍යාංශයෙන් ලද එකතු වටිනාකම රු.58,930,000ක් වන වාහන 9ක් හා මුදල් අමාත්‍යාංශයෙන් ලද එකතු වටිනාකම වූ රු.21,500,000 ක් වන වාහන | එකතු වටිනාකම රු.80,430,000ක් වූ වටිනාකමක් සහිත වාහන 12 මෙම අමාත්‍යාංශය වෙත වෙන්කර ලිපියක් මගින් භාර දී ඇත. මේ දක්වා ඒවායේ අයිතිය මෙම අමාත්‍යාංශය වෙත පවරා | වාහන වල නීත්‍යානුකූල අයිතිය පවරා ගෙන ගිණුම්ගත කිරීම කළ යුතුයි. |

| | |
|---|---|
| 3ක් ලෙස එකතු වටිනාකම රු.80,430,000ක් වූ වාහන 12ක වටිනාකම අමාත්‍යාංශයේ ජංගම නොවන වත්කම් තුළ ඇතුලත් කර තිබුණි. ඉහත සඳහන් වාහන 12න් එකතු වටිනාකම රු.36,230,000ක් වූ වාහන 6ක වටිනාකම් කර්මාන්ත අමාත්‍යාංශ මූල්‍ය ප්‍රකාශන වල ද ඇතුලත්ව තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි මූල්‍ය නොවන වත්කම් හා දේපළ පිරියත උපකරණ සංචිත රු.80,430,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නැතත් එම වාහන වල සියළුම ආර්ථික ප්‍රතිලාභ ලබා ගන්නේ මෙම අමාත්‍යාංශය නිසාත් සියළුම ඉන්ධන වියදම් හා නඩත්තු වියදම් දරන්නේ ද මෙම අමාත්‍යාංශය නිසාත් මූල්‍ය ප්‍රකාශන වල පෙන්වීම වඩාත් සාධාරණ බව පෙනී ගිය හෙයින් එම වටිනාකම් ඇතුලත් කර ඇත. එහෙත් විගණන නිරීක්ෂණ මඟින් එය දෝෂයක් ලෙස පෙන්වා ඇති බැවින් 2022 අප්‍රේල් මස භාණ්ඩාගාර වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරන ලද බව. |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **<u>බැරකම් පිළිබඳ ලේඛනය</u>**<br>මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | CIGAS ගිණුම් පද්ධතිය හරහා සෑම මසකම බැරකම් සියල්ල ඇතුලත් කිරීම ගිණුම් ක්‍රියාවලියේ මූලික කොටසක් බැවින් වෙනම ලේඛනයක් ලිඛිතව පවත්වා නොමැති බවත්, එය අඩුපාඩුවක් ලෙස විගණනයෙන් පෙන්වා ඇති බැවින් බැරකම් ලේඛනයක් ආරම්භ කර යාවත්කාලීන කිරීමට නිලධාරීන් දැනුවත් කරන ලද බව. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | **<u>වැය ලෙජරය</u>** | | |
| | මුදල් රෙගුලාසි 447 ප්‍රකාර දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය යාවත්කාලින කර නොතිබුණි. | මෙම වර්ෂයේ සිට නිසි පරිදි පවත්වාගෙන යනු ලබන බව. | මුදල් රෙගුලාසි 447 හි සඳහන් විධිවිධාන ඇතුළත් වන පරිදි 138 වැනි පොදු පෝර්මය අනුව දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරයක් පවත්වා ගත යුතුය. |
| (ඇ) | **<u>පොදු තැන්පත් ලේඛනය</u>** | | |
| | යාවත්කාලීන කර නොතිබුණි. | යාවත්කාලීන කිරීම් මේ වන විට නිසි ලෙස සිදු නොවුණත් ඒවා නිවැරදි කර ඇති බව | යාවත්කාලීන කර පවත්වා ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ඈ) | **<u>හානි පාඩු ලේඛනය</u>** | | |
| | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පාඩු පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | වර්ෂය තුල හානි හා පාඩු වාර්තා නොවූ බැවින් ලේඛනයක් ආරම්භ කර නොතිබූ අතර මේ වන විට එය නිවැරදි කර ඇති බව. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. |

### 1.6.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි | මේ වන විට අභ්‍යන්තර විගණක තනතුර සඳහා නිලධාරීයෙකු ලැබී නොමැති බැවින් එම කටයුතු අඩාලව පැවතුණද කඩිනමින් විසඳා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | විගණන පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ආ) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | පුරප්පාඩු වී ඇති අභ්‍යන්තර විගණක තනතුර සඳහා නිලධාරියෙකු කඩිනමින් ලබාදෙන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් යොමු කර ඇත. ඉදිරියේ දී එම කටයුතු සාර්ථකව නිමකර ගැනීමට අපේක්ෂා කරන බව. | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කළ යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය
---------------------------

## 2.1 බැරකම් හා බැදීම් වලට එළඹීම

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>--------------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 94 (2) හා (3) ප්‍රකාරව එළඹෙන ලද බැදීම් ප්‍රකාශයෙහි සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2022 වර්ෂයේ දරන ලද රු.996,091 ක් වූ වියදම්, බැරකම් ලෙස ඇතුළත්ව නොතිබුණි. | මෙවැනි දෝෂ ඉදිරියේදී සිදු නොවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නිලධාරීන් දැනුවත් කරන ලද බව. | එළඹෙන ලද බැදීම් ප්‍රකාශයෙහි වර්ෂයට අදාල සියළුම බැරකම් ඇතුලත් කළ යුතුයි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.4,359,899ක් වූ බැරකම් සඳහා අමාත්‍යාංශය එළඹ තිබුණද, එම වටිනාකම භාණ්ඩාගාරයට වාර්තා නොකිරීම හේතුවෙන් භාණ්ඩාගාරයේ මාසික බැරකම් / සංචිත සාරාංශ වාර්තාවෙහි (SA 90) බැරකම් සම්බන්ධ කිසිඳු තොරතුරක් ඇතුළත් වී නොතිබුණි. | සෑම මසකම නව **CIGAS** ගිණුම් පද්ධතිය හරහා වියදම් වාර්තා කිරීමේ දී පළමුව **Commitment** ලෙස ඇතුලත් කර දෙවනුව **Liability** ලෙස ගෙන අවසාන පියවර වශයෙන් ගෙවීම් කරන නිසා සහ වර්ෂයට අදාලව පැහැදිලිව හඳුනා ගැනීමට අතපසු වීම නිසා ඉහත අඩුපාඩු සිදු වී ඇතත් අනෙකුත් බැරකම් නිසි ලෙස භාණ්ඩාගාරයට වාර්තා කර ඇත. එසේම භාණ්ඩාගාර ගිණුම් මුදල් පදනම මත සිදුවන බැවින් සහ වර්ෂයේ වියදම් වලට අදාල කර නොගන්නා බැවින් | එළඹෙන ලද සියළුම බැරකම් භාණ්ඩාගාරයට වාර්තා කළ යුතුය. |

මූල්‍ය ප්‍රතිඵල වලට සැලකිය යුතු බලපෑමක් ඇති නොවන බව නිරීක්ෂණය කරන ලද බව.

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2021 සැප්තැම්බර් 06 දින ඉදිරිපත් කර තිබූ ප්‍රතිශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති 7 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 500 ක් වෙන් කර තිබුණ අතර 2021 දෙසැම්බර් 31 දින රුපියල් මිලියන 302.31 ක් වැය කර තිබුණි. ඇස්තමේන්තු වටිනාකම රුපියල් මිලියන 15 ක් වූ ව්‍යාපෘතින් 2021 වර්ෂය තුලදී ක්‍රියාත්මක කර නොතිබුණු අතර දේශීය ඇඟළුම් ගම්මාන 30 ක් ස්ථාපිත කිරීම සඳහා රු මිලියන 30ක් වෙන් කර තිබුණද ගම්මාන 19ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. දේශීය බතික් හා ඇඟළුම් නිෂ්පාදන ප්‍රවර්ධන සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා කිහිපයක් ඉදිරිපත් කර ඇතත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසු විපරම් කිරීම කිරීමක් සිදුකර නොතිබුණි. | 2020 සහ 2021 වර්ෂවල රටේ පැවති කොරෝනා වසංගතය හේතුවෙන් නිරෝධානය ඇදිරි නිතීය පැනවීම නිසා අපේක්ෂිත වැඩසටහන් වල ව්‍යාපෘති ග්‍රාමීය මට්ටමින් හඳුනා ගැනීම දුෂ්කර වීම නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වි තිබූ බව. ඒ අනුව නිශ්චිත කාලය තුළ ඇස්තමේන්තු වටිනාකම අනුව රු.මිලියන 15 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අපහසු වී ඇති අතර 2021 අගෝස්තු 30 දින රාජ්‍ය වියදම් සමාලෝචනය පිළිබඳ වූ අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ප්‍රතිපාදන ඉතිරි කරන ලෙස දැනුම් දීම අනුව රු.මිලියන 500 ක් වූ ප්‍රතිපාදන රු.මිලියන 339 දක්වා අඩු කරනු ලැබ තිබුණි. ඒ අනුව රු.මිලියන 302.1ක් 2021 දෙසැම්බර් 31 දිනට වියදම් කර සියයට 89 ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගනු ලැබූ බව. දැනට මාණ්ඩලික නිලධාරී බහුතරයක් පුරප්පාඩු පුරවා ඇති බැවින් ඉදිරියේ දී පසුවිපරම් ක්‍රියාවලිය ක්‍රමවත්ව ඉටුකිරීමට හැකියාව ඇති බව. | ලබාදුන් ප්‍රතිපාදනවලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුයි. |

## 3.2 ප්‍රසම්පාදන

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය හා 2020 අගෝස්තු 28 දිනැති 2020/02 චක්‍රලේඛයේ 4 වගන්තිය ප්‍රකාරව ගණන් දීමේ නිලධාරියා විසින් අමාත්‍යාංශයේ වාර්ෂික පුනරාවර්තන සහ ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කොට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන එහි පිටපතක් ප්‍රසම්පාදන කොමිෂන් සභාව, විගණකාධිපති හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු වුවත් 2021 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් අමාත්‍යාංශය විසින් සකස් කර නොතිබුණි. ඒ අනුව 2021 වර්ෂය සඳහා රු.මිලියන 3,550 ක්වූ ප්‍රාග්ධන ප්‍රතිපාදනය නිසි සැලැස්මක් තුල සිදුකර නොතිබුණි. | 2022 සඳහා නියමිත වකවානු තුල සැපයුම් සකස් කර අවශ්‍ය අනුමැතියන් ලබා ඇති අතර ඉදිරියේ දී එවැනි දෝෂ ඇති නොවීමට කටයුතු සම්පදානය කර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 880 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 9 ඡේදය ප්‍රකාරව ඇප තැබීමට අවශ්‍ය නිලධාරීන් සඳහා ඇප තැබීමක් සිදුකර නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරින් පිළිබඳව නැවත සොයා බලා නිවැරදි කරන ලෙස විෂය භාර නිලධාරින් දැනුවත් කර ඇති බව හා ඉදිරියේ දී එය නිවැරදි වනු ඇති බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.4 පාඩු හා හානි

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 22 දින අංක KS - 2354 දරන රථයට සිදු වූ අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (3) වගන්තිය ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාවක් නිකුත් කර අනතුරේ ස්වභාවය, එහි ප්‍රමාණය යන කරුණු අනාවරණය කර ගැනීමට අවශ්‍ය කටයුතු විගණිත දින තෙක් කර නොතිබුණි. තවද මේ පිළිබඳ පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය යටතේ මූල්‍ය ප්‍රකාශ වල දක්වා නොතිබුණි. | **KS** – 2354 දරණ රථයේ අනතුර සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සමාගමෙන් සම්පූර්ණ හිමිකම් ප්‍රදානය කිරීමට එකඟව ඇති බැවින් පාඩුවක් සිදු වී නොමැති බව. කෙසේ වෙතත් මු.රෙ 104 (3) පරීක්ෂණය නොපැවැත්වීම අඩුපාඩුවක් බැවින් එම කටයුතු සිදුකරමින් පවතින බව. | අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | අංක PE –1858 දරණ කැබ් රථය 2021 ජනවාරි 13 දින අනතුරකට ලක් වී තිබුණි. මුදල් රෙගුලාසි 104 (3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාව නිකුත් කිරීම 2021 ඔක්තෝබර් 29 දක්වා ප්‍රමාද වී තිබුණු අතර මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව පූර්ණ වාර්තාව ඉදිරිපත් කිරීමට 2022 පෙබරවාරි 10 දින දක්වා ප්‍රමාද වි තිබුණි. මේ පිළිබඳ මූල්‍ය ප්‍රකාශ වල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය යටතේ දක්වා නොතිබුණි. | ගරු රාජ්‍ය අමාත්‍යතුමා වෙත ලබා දී තිබූ අංක PE – 1858 දරණ කැබ් රථය 2021.01.13 දින අනතුරකට ලක් වී තිබුණ ද, එම අනතුර පිළිබඳව අමාත්‍යාංශය වෙත වාර්තා කොට තිබුණේ 2021 ජූලි 21 වන දින බව, මෙම පරීක්ෂණ යම් ප්‍රමාද වීමක් සිදු වූයේ නම් එය මෙම අමාත්‍යාංශයට පාලනය කළ නොහැකි බාහිර කරුණක් වූ කොවිඩ් 19 වසංගත තත්ත්වය මත රට තුළ ඇති වූ පරිසරය මත සිදු වූ කරුණක් බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නොපමාව කටයුතු කර මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කළ යුතුයි. |

**3.5 අවිධිමත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇඟළුම් නිෂ්පාදන ආයතනයන් සඳහා නිමි ඇඳුම් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය උපකරණ බෙදා දීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වූ යෝජනාව 2021 ජූලි 26 දින අමාත්‍යාංශ ලේකම් වෙත වයඹ පළාත් මාර්ග, ප්‍රවාහන, නිවාස හා ඉදිකිරීම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශ ලේකම් විසින් ඉදිරිපත් කර තිබුණ ද, මිලදී ගත යුතු උපකරණ, ප්‍රමාණ, වියදම් ඇස්තමේන්තු සකස් කර අවශ්‍ය මිලදී ගැනිම් කටයුතු සිදු කිරීම 2021 නොවැම්බර් 29 දක්වා ප්‍රමාද වී තිබුණි. ඒ අනුව අවශ්‍ය මිලදී ගැනීම් සඳහා රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව වෙත අංක 388109 දරණ රු.26,436,790ක් වූ චෙක්පත 2021 දෙසැම්බර් 31 දින ලියා තිබුණ ද විගණන දිනය වූ 2022 අප්‍රේල් 6 දක්වා එම චෙක්පත නිකුත් කොට නොතිබුණු අතර අවශ්‍ය භාණ්ඩද ලබාගෙන නොතිබුණි. මුදල් රෙගුලාසි 137, 138, 139 ප්‍රකාරව අනුමත කිරීමේ, සහතික කිරීමේ හා ගෙවීමේ නිලධාරීන් සෑම ගෙවීමක් සම්බන්ධයෙන්ම අදාල භාණ්ඩ නිවැරදි ලෙස භාරගෙන ඇති බවට, සෑම වවුචරයක්ම සම්පූර්ණ බවට ගණන් දීමේ නිලධාරියාට වගකිව යුතු වුවත්, උක්ත ගෙවීම ඉහත රෙගුලාසි වල සඳහන් නියමයන්ට අනුකූල නොවන ලෙස සිදු කර තිබුණි. | කුඩා පරිමාණ ඇඟළුම් කර්මාන්ත 30ක් ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබුණත් එවකට රටේ පැවති කොරෝනා වසංගතය තත්ත්වය හමුවේ සුදුසු ස්ථාන හඳුනා ගැනිම ප්‍රමාද වූ බව හා සියළුම උපකරණ තාක්ෂණ කමිටුවේ පරීක්ෂාවෙන් පසු හා අදාල භාණ්ඩ භාර දීමේ නියෝගය ලද පසු චෙක්පත නිකුත් කිරීමට කටයුතු යොදා තිබූ අතර එම උපකරණ ගෙනවිත් භාර දුන් බවට තහවුරුවක් නොලැබූ නිසා චෙක්පත නිකුත් කිරීමටද නොහැකි වීමෙන් හා රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව රාජ්‍ය ආයතනයක් නිසාවෙන් 2021 දෙසැම්බර් 31 දින ලියන ලද චෙක්පත රඳවා ගත් බව. | සියළුම ගෙවීම් මුදල් රෙගුලාසි වල සඳහන් නියමයන්ට අනුකූලව සිදුකළ යුතුයි. |

**4 යහපාලනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (2) වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුව අභ්‍යන්තර විගණකයෙකු පත්කර නොතිබුණි. | මේ වන විට ගත හැකි සෑම උත්සාහයක්ම දරා ඇතත් අභ්‍යාන්තර විගණන තනතුර සඳහා නිලධරයකු ලැබී නොමැති අතර ඉදිරියේ දි කඩිනමින් විසඳා ගැනීමට බලාපොරොත්තු වන බව. | අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුයි. |

**5. මානව සම්පත් කළමනාකරණය**

**5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තත්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් තනතුරු 21 ක් සඳහා සේවක සංඛ්‍යාව 59 ක් අනුමත කර තිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට තත්‍ය සේවක සංඛ්‍යාව 28 වූයෙන් තනතුරු 13ක් සඳහා සේවකයින් 31 ක පුරප්පාඩු පවතින බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වය අමාත්‍යාංශයේ පරිපාලන කටයුතු, කාර්යසාධනය කෙරෙහි සෘජුව බලපා තිබුණි. මෙම පුරප්පාඩු තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ, සහකාර ලේකම්, අභ්‍යන්තර විගණක යන තනතුරු පැවතුණි. අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවූ සහකාර ලේකම්වරයෙකු වෘත්තීය සමිති හා සේවක සබඳතා සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි තාවකාලික පදනම මත බඳවාගෙන තිබුණි. | කාර්ය මණ්ඩල පුරප්පාඩු සඳහා සියළු ක්‍රියාමාර්ග ගෙන ඉදිරියේ දී කඩිනමින් විසඳෙනු ඇති බව. | අනුමත සහ ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් පවත්වා ගැනීමට ක්‍රියා කළ යුතු වීම. |